# මීඩියා බයියාකරණය

බොහෝ වචන වල ශබ්ද කෝෂමය අරුත් ඒවායේ ඓතිහාසික කාර්යාවලිය ඉවර කරලා කෝෂ ග්‍රන්ථ වල පිටු උඩ සැතපෙන බව හුඟක් දෙනා දන්නෙත් නෑ දැන ගන්න උවමනාවකුත් නෑ. "සාමය" කියන වචනෙට අද ලංකාව ඇතුළෙ තියන තේරුම ගැන ඩිංගක් හිතුවොත් මේ හරුපෙ පැහැදිලි කර ගන්න ලේසියි. පවතින ක්‍රමය මගින් ජනනය කරපු වෙනම අරුතක් වචන එක්ක යා වෙලා තියනවා. "වචන" මගින් "වෙනසක්" උපදවන්නට තැත් කරන ඕනෑම කෙනෙක් එම වචන මත බලපවත්වන මේ අතිරේක අරුත් විවරණය කර ගන්න ඕනේ. සමහර වචනයක් වෙනුවට උපක්‍රමශීලී ලෙස වෙනත් වචනයක් යොදා ගන්න සිදු වෙන්නත් පුළුවන්.

"සාහිත්‍යය" කියන්නෙත් එහෙම වචනයක්. විදග්ධ කතිකා ඇතුළෙ මේ වචනෙට කුමාර සැලකිල්ලක් තිබුනට රාමුවෙන් එළියෙ මහ පාරෙ ඉන්න එකෙක් මේක තේරුම් ගන්නෙ පයිසෙකට වැඩක් නැති බම්බුවක් විදිහට. උන්ට ඒක පේන්නේ උන්ගෙ වැඩක් විදිහට නෙමේ. වෙන කාගෙද මොකද්ද එකක් විදිහට. ලංකාව ගත්තොත් මේක මහපාරට පේන්නේ ඇගේ අමාරුව තියන එවුං ටිකක් නොතේරෙන භාෂාවකින් මොකද්ද කෙහෙල්මලක් කියනවා.... උං උං එක එක දේවල් අල්ල ගෙන රණ්ඩු කරනවා.... උං පොත් ගහනවා... උංගෙම එවුං අරං බලනවා... ඔන්න ඔය වගේ එකක්. කොටින්ම උන්ට මේක උන්ගෙ ජීවිත වලට ආලෝක වර්ෂ දහ දාහක් විතර දුර තරුවක තියන එළිය තරම්වත් වැදගත් නැහැ....
"සාහිත්‍යය" කියන දේ එදිනෙදා ජීවිත වලට වටිනාකමක් වශයෙන් එකතු කර ගැනීමට බහුතරයක් මිනිස්සු සූදානම් නැත්තේ ඇයි? මෙහෙම වෙන්න බලපාන ලද කාරණා සම්බන්ධයෙන් ටිකක් "හයියෙන්" හිතන්න වෙනවා.

ඇත්තටම පවතින තත්ත්වය නම්, ආහාර, ඇඳුම්, නිවාස යනාදී මූලික අවශ්‍යතා ලැයිස්තුවෙ "වාටියෙ"වත් "සාහිත්‍යය" නැහැ. ප්‍රාථමික අවශ්‍යතා ඉටු කරගන්න යොදන "බර" වෙන වෙන දේවල් වෙනුවෙන් වියදම් කරගන්න කෙනෙක් කැමති නැහැ. අවශ්‍යතා අධි-නිශ්චය කරපු පාරිභෝජනවාදී ජීවන රටාවක් ඇතුළේ තම තමන්ගේ ගොඩ වැඩි කරගැනීමට මාරාන්තික සටනක් කරන කොට, සාපේක්ෂව ජීවිත සමග අඩුවෙන් බද්ධ වුණු දේවල් කොහොමටත් හැලිලා යන එක ස්වභාවිකයි. හුදෙක් බඩ, බඩ සහ බඩ වෙනුවෙන් පමණක් ජීවිතය වියදම් කරන කෙනෙකුට සාහිත්‍යය යනු "බඩේ" ඉඩ තිබ්බොත් විතරක් සලකා බලන අතුරුපසක් පමණයි.

මේකෙදි ඉතාම තීරණාත්මක දේ තමා අපි පවතින ක්‍රමය සමග එකඟ ද නැද්ද යන්න. කිසිදු ප්‍රතිරෝධයක් නැතුව නිවට ලෙස සිදු වෙමින් පවතින සියල්ල ඉවසනවද කියන එක. අද, හෙට හෝ එළඹෙන අනාගත දිනක අපට හෝ අපේ දරුවන් වෙනුවෙන් ලෝකය වෙනස් කළ යුතු බව තේරුම් ගන්න එක. එහෙම සිතිවිලි මාත්‍රයක් හෝ තිබෙන කෙනෙකුට "සාහිත්‍යය" කියන්නේ තව දුරටත් ද්විතීයික අවශ්‍යතාවයක් නෙමේ. වෙනසක් වෙනුවෙන් ලෝකය සූදානම් කළ හැකි ටූල් එකක් ලෙස "සාහිත්‍යයේ" වටිනාකම ඉතිහාසය විසින් සිය දහස් වාරයක් සනාථ කරලා තියනවා. "සාහිත්‍යය" එයට හිමි නිසි තැන තබන එක දේශපාලනික වැඩක් වෙන්නෙ මේ අරුතෙන්.

වසල වෙලෙඳ න්‍යාය පත්‍රයකට දුවන මේ ක්‍රමයට අවශ්‍ය "බයියෝ".
බයියන් අන්දන්න ලේසියි. තමන්ගේ ලාභ රේට්ටුව ඉහළ දමා ගැනීමේ මාරාන්තික තරඟයේ ප්‍රේක්ෂකාගාරයට උන්ට ඕන වෙන්නෙ හිතන්න බැරි- සිදු වෙමින් තියන දේ ඇනලයිස් කර ගන්න බැරි මැට්ටි හරක් රංචුවක්. මේ බයියොගහණය වැඩි කරගැනීමේ කොන්ත්‍රාතුව කරන්නෙ මීඩියා වලින්.
මිනිස්සුන්ගෙ හීන ඇතුළට උන් එන්නත් කරන්නෙ මොනවාද කියල හිතපුවහම මේ කියන දේ හරි සිම්පල්. කොටින්ම මිනිස්සුන්ගේ තින්කිං කැපෑසිටි වැඩි වෙන එක මේ වසලයන්ට භයානක හීනයක් වෙන්නේත්- එනිසාම හිතන්න පුළුවන් මිනිස්සු වැඩි කරගන්න එක දේශපාලනික වැඩක් වෙන්නේත් ඔන්න ඔය අරුතෙන්.
දැං අපි මුලින් කතා කළ "රාමුවෙන්" ඇතුළට එමු. ඇතුළේ ඉන්න එවුන් පිට ඉන්න එවුන්ව ඇතුළට දිනා ගන්න එක අනිවාර්යයක් බව දැන් පැහැදිලියි. පිට ඉන්න එවුන් ඇතුළට යන එක වළක්වන්න අශ්වබල ලක්ෂ ගානක යෝධ බලයක් ක්‍රියාත්මක වෙනවා. ඇතුළේ ඉන්න එවුන් මේ යෝධ බලයට එරෙහිව ප්‍රමාණවත් ප්‍රතිරෝධයක් ඇති නොකළොත් මේ දිනා ගැනීම කරන්න බැහැ. මේ ප්‍රතිරෝධය අහසින් කඩා වැටිලා "සාහිත්‍ය-ප්‍රේමී සමාජයක්" ඔටෝ බිහි වෙන තුරු තම තමන්ගේ වැඩ බලාගෙන ඉන්න එක හිනා යන විහිළුවක්. ඒක මේ කපේදි වෙන්නෙ නෑ. ඇතුළෙ ගොඩ විශාල කර ගැනීමට නව මං සොයා යෑම අත්‍යවශ්‍යයි. එළියේ ඉන්න එවුන්ට නිදිමත උපදවන වැඩ වලින් මේ දේ කරන්නත් බැහැ.

මෙන්න මේ පොයින්ට් එකේදි තමා බයියාකරණය සඳහා වැඩෙහි යොදවා තිබෙන මූලෝපායන් සහ උපකරණ ගැන නිසි හඳුනාගැනීමක් කරන්න ඕනේ. යමක් ප්‍රතියෝජනය කරන්න නිශ්චිත හැදෑරීමක් අත්‍යාවශ්‍යයි! "අනේ අපිනං ඕවට නෑ" කියන "වයිපර්" ප්‍රතිපත්තියෙන්වත්, සාහිත්‍ය කලා ආදියට තිබෙනවා කියා සිතන ඊනියා කන්‍යාභාවය ගැන වොරි වීමෙන්වත් මේ දෙය කරන්න බෑ. සාමූහිකවත්, තම තමන්ගේ පුද්ගල සීමා තුළත් මේ වෙනුවෙන් හැදෑරීම, අන් අය දැනුවත් කිරීම සහ ක්‍රියාත්මක වීම අවශ්‍යයි.

එළියේ පොදු සමාජය තුළ "සාහිත්‍යය" යනු බෝරිං වැඩක් ලෙස තිබෙන අදහස වෙනස් කළ යුතුයි. "සාහිත්‍යය" යනු වින්දනාත්මක දෙයක් බවත් ඒක "ආතල් කඩන" වැඩක් නොව "මාර ආතල්" වැඩක් බවත් පොදු සමාජ විඥානය තුළට එන්නත් කළ යුතුයි.

මීඩියා බයියාකරණයෙන් සිහි විසඥව සිටින සමාජයක් තුළ මේ වැඩේ කරන එක ඇඟ රිදෙන වැඩක් බව ඇත්තයි. නමුත්, ඉඩ තිබෙන හැම සිදුරකින්ම රිංගමින්, නව උපක්‍රම සොයමින්, නව මාධ්‍යයන් නිපදවමින්, තිබෙන මාධ්‍යයන්ගෙන් වැඩ ගනිමින් මේ අමාරු වැඩේ කළ යුතුයි. මල් ඉබේ පිපෙන කාලය අවසන් බවත්- දැන් ඇත්තේ මල් බලෙන් පුදවන්නට සිදු වී ඇති කාලයක් බවත් තේරුම් ගැනීමෙන් මේ සඳහා අපට අවශ්‍ය පෙළඹවීම ලැබෙනවා.

හුඟාක් දුර යන්න කලින් තමන් සහ තමන් අවට සිටින සමීපම අයගෙන් පටන් ගන්න. ඔවුන්ට බයියාකරණය සහ එහි අරමුණු පහදන්න. ඇතුළක් නැති බයියෙකු වෙනවාට වඩා පොතක් පතක් කියවන, සිතිවිලි අකුරු කරන, ඒවා සමාජය සමග බෙදා ගන්නා මිනිසෙකු වීම වැදගත් බව පහදන්න.

ඔබ මවක් නම් පියෙක් නම් මීඩියා මැජික් ගැන දරුවන්ට කියාදෙන්න. මැජික් ඇත්තේ



**ඔබ මවක් නම් පියෙක් නම් මීඩියා මැජික් ගැන දරුවන්ට කියාදෙන්න. මැජික් ඇත්තේ මේ නපුංසකයන් ළඟ නොව මිනිස් සිතිවිලි ද උන්ගේ විඳීම් ද නිදන් කොට තැනූ පොත-පතෙහි බව උන්ට උගන්වන්න.**
**ඔබ රැකියාවක් කරන්නෙක් නම් හැම මාසයකම වේතනයෙන් සුළු මුදලක් වියදම් කොට පොතක් ගෙදර ගෙනියන්න.**
**පොත් රාක්කය යනු නිවසේ වටිනාම තැනයි!**
**හැකි සැම විටම අන් අය කියවන්නට පොළඹවන්න. ලියන්නට දිරි දෙන්න.**

මේ නපුංසකයන් ළඟ නොව මිනිස් සිතිවිලි ද උන්ගේ විඳීම් ද නිදන් කොට තැනූ පොත-පතෙහි බව උන්ට උගන්වන්න.
ඔබ රැකියාවක් කරන්නෙක් නම් හැම මාසයකම වේතනයෙන් සුළු මුදලක් වියදම් කොට පොතක් ගෙදර ගෙනියන්න.
පොත් රාක්කය යනු නිවසේ වටිනාම තැනයි!
හැකි සැම විටම අන් අය කියවන්නට පොළඹවන්න. ලියන්නට දිරි දෙන්න.

ඉසුරුමත්කම ඇත්තේ ඇඳුමෙහි හෝ කර බඳින රත්තරං වල නොව පොත පතෙන් ඔබ උකහා ගත් දෙයෙහි සහ එමගින් පෙරලා ලෝකයට ඔබ ප්‍රදානය කරන දෙයෙහිත් බව ඔවුන්ට උගන්වන්න.
අකුරු අනුරාගිකයි! විඳීම් ඉන්ද්‍රජාලිකයි!


තරංග ජයසේන

koombiyaonline@gmail.com



# TAX - RETURN

**Do you want the maximum Tax Refund Quickly? We prepare tax returns with the lowest possible tax legally payable.**

- *Preparation & Lodgement of Tax Returns*
- *Preparation & Lodgement of Business Activity Statements*
- *GST Registration*
- *Income Activity Statements*
- *Lodgement of ABN & TFN applications*
- *Business name registration*
- *Bookkeeping*

**Dave Susith Balapitiya** MBA, BSc, MNIA, MAAT, ASA

**WIZARD ACCOUNTING**

*Registered Tax agent & Professional Accountant*

**Office hours** Friday 8.30am to 10.00pm
Monday to Thursday 6.30pm & 10.00 pm
Saturday & Sunday 8.30am to 5.00 pm

**Tel** 03 9711 5743 — 31 Eildon Drive
**Mobile** 0433 58 49 68 — Keysborough 3173
**Email: wizaccounting@optusnet.com.au** — (Mel Ref 89 B8)